# සිංහල

## විෂය නිර්දේශය

(සංශෝධිත පිටපත)

# 12 -13 ශ්‍රේණි

(2017 සිට ක්‍රියාත්මක වේ)

සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.lk

සිංහල

12, 13 ශ්‍රේණි

විෂය නිර්දේශය

© ජාතික අධ්‍යාපන ආයතනය

සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය,
ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් ලිපිනය : info@ nie.lk

# පටුන


| | පිටු අංකය |
|---|---|
| පෙරවදන | 2 |
| හැඳින්වීම | 3 |
| ජාතික පොදු අරමුණු | 4 -5 |
| මූලික නිපුණතා | 6 |
| විෂය අරමුණු | 7 |
| ජාතික පොදු අරමුණු සහ විෂය අරමුණු අතර සම්බන්ධතාව | 8 |
| විෂය නිර්දේශය | 9 - 46 |

# පෙරවදන

ශ්‍රී ලංකාවේ පාසල් විෂය මාලාවෙහි අ. පො. ස (උ.පෙළ) සිංහල විෂය සඳහා මෙම විෂය නිර්දේශය සම්පාදිත ය. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරන යටතේ මෙම විෂය නිර්දේශය පාසල් පද්ධතියෙහි ක්‍රියාත්මක වීමට නියමිත ව ඇත්තේ 2017 වර්ෂයේ සිට ය.

මෙම නව විෂය නිර්දේශය සම්පාදනයේ දී දේශීය මෙන් ම විදේශීය භාෂා විෂයයන් සඳහා වූ විෂය නිර්දේශ අප විසින් අධ්‍යයනය කරන ලද අතර කාලීන සාමාජීය හා දේශපාලනික ප්‍රවණතා තුළින් පැන නැගෙන ආධ්‍යාපනික අවශ්‍යතා කෙරෙහි ද අවධානය යොමු කරන ලදී. එහි දී අ.පො.ස.(උ.පෙළ) විභාගය සමත් වීම සඳහා ශිෂ්‍යයා සූදානම් කිරීම මෙම විෂය නිර්දේශයේ එක ම අරමුණ ලෙස නොසැලකිනි. ගැඹුරු භාෂා ඥානයක් ශිෂ්‍යයාට ලබා දෙන අතර රසවින්දනාත්මක හා විචාරාත්මක කුසලතා ශිෂ්‍යයා තුළ වර්ධනය කිරීමත් භාෂා භාවිතයේ ප්‍රායෝගික පරිචය අත් පත් කර දීමත් එමගින් නිර්මාණකරණයට යොමු කිරීමත් මෙම විෂය නිර්දේශයේ අරමුණු අතර වෙයි.

මෙම විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම් ඇතුළත් ගුරු මාර්ගෝපදේශ දෙකක් 12 සහ 13 ශ්‍රේණි සඳහා ඉදිරියේ දී හඳුන්වා දීමට නියමිත ය. විභාග කඩඉම ජය ගන්නා අතර ම භාෂා ඥානයෙන් හා පරිචයෙන් පිරිපුන් වීමට මෙම විෂය නිර්දේශය විද්‍යාර්ථීන්ට අත්වැලක් වේවා! යනු අපගේ පැතුමයි.

විෂය නිර්දේශ සම්පාදක මණ්ඩලය

## හැඳින්වීම

සිංහල භාෂාව ලෝකයේ ඇති සුබනම්‍ය ජීව භාෂාවලින් එකකි . වසර දහස් ගණනක් තිස්සේ ඉතිහාසයේ විවිධ කඩඉම් පසු කරමින් විකාශනය වූ සිංහල භාෂාව සාරගර්භ සාහිත්‍යයකට ද හිමිකම් කියයි. සිංහල භාෂාව වහරනුයේ ලෝක ජනගහනයට සාපේක්ෂ ව කුඩා පිරිසක් වුව ද සාරවත් බවින් හෙළ බස ලෝකයේ සෙසු කවර බසකට වුව දෙවැනි වෙති යි සිතිය නොහේ. වර්තමාන ශ්‍රී ලාංකේය පාසල් අධ්‍යාපනයේ ප්‍රධාන මාධ්‍ය භාෂාව වන්නේ ද සිංහල භාෂාවයි. පාසල් අධ්‍යාපනයට පිවිසෙන ශිෂ්‍යයා සිංහල භාෂාව විධිමත් ලෙස හැදෑරීම ආරම්භ කරනුයේ පාසලේ පළමු ශ්‍රේණියේ පටන් ම ය. පාසලේ කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය සම්පූර්ණ කරන අවස්ථාව වන විට ශිෂ්‍යයා ස්වකීය මවු භාෂාව පිළිබඳ යම් පරිචයක් අත් පත් කර ගෙන සිටී.

මෙම මූලික භාෂා පරිචය සහිත ව කලා විෂය ධාරාවෙන් අ.පො.ස (උසස් පෙළ) හැදෑරීම සඳහා පිවිසෙන ශිෂ්‍යයා තමාට තෝරා ගැනීමට ඇති විෂය රාශියක් අතුරෙන් 'සිංහල' විෂයය තෝරා ගැනීම කෙරෙහි හේතු කිහිපයක් බලපෑ හැකි ය. සිංහල භාෂාව හා සාහිත්‍යය පිළිබඳ ස්වකීය දැනුම සහ අවබෝධය තව දුරටත් පුළුල් කර ගැනීම එක් අරමුණක් විය හැකි ය. අනාගත රැකියා ලෝකය ජය ගැනීම තවත් අරමුණක් වනු ඇත. හුදෙක් භාෂාව හා සාහිත්‍යයට ඇති ඇල්ම නිසා ම මෙම විෂය තෝරා ගන්නා ශිෂ්‍ය පිරිස් ද සිටීමට ඉඩ ඇත.

එනයින් නව විෂය නිර්දේශය සකස් කිරීමේ දී ඉහත කී සෑම අරමුණක් කෙරෙහි ම අවධානය යොමු කරන ලද බව කිව යුතු ය. සිංහල භාෂාවේ ගැඹුර මෙන් ම මිහිර ද අත්විඳීමේ අවස්ථාව විද්‍යාර්ථීන්ට අත් පත් කර දෙන අතර ම භාෂාව නිවැරදි ව හා මැනවින් හැසිර වීමේ පරිචය ශිෂ්‍යයාට ලබා දීම අපගේ අපේක්ෂාවයි.

නිපුණතා පාදක වූ මෙම විෂය නිර්දේශය; පුරාතන හා නූතන ගද්‍ය, පද්‍ය සාහිත්‍යය, නාට්‍ය, ව්‍යාකරණ හා ප්‍රායෝගික භාෂා කුසලතා යන විෂය ක්ෂේත්‍ර ආවරණය කෙරෙන පරිදි සකස් කර ඇත. එකී නිපුණතා සාක්ෂාත් වන පරිදි හා විෂය සන්ධාරය ආවරණය වන අයුරින් සුදුසු ඉගෙනුම් - ඉගැන්වීම් අත්දැකීම් සංවිධානය කර ගැනීමේ නිදහස ගුරුවරයා සතු ව පවතී. සිංහල භාෂාව හා සාහිත්‍යය කෙරෙහි මනා ඇල්මකින් යුත්, භාෂා පරිචයෙන් පිරිපුන් ශිෂ්‍යයකු බිහි කරලීමට මෙම නව විෂය නිර්දේශය පිටුබලයක් වනු ඇතැයි අපේක්ෂිත ය.

## ජාතික පොදු අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලිය තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනයෙන් ළඟා කර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගනු ලැබ ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීමෙන් ජාතිය ගොඩ නැගීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම.

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.

IV පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය මගින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් වාර්තාව, 2003)

# මූලික නිපුණතා

අධ්‍යාපනය මගින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා, ඉහත සඳහන් ජාතික අරමුණු ඉටු කර ගැනීමට දායක වනු ඇත.

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනු කාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් කර ගනී.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම.

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය.

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම.

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගි කර ගැනීම.

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා.
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයන්.
- චිත්තවේගී බුද්ධිය.

(III) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමය පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්.

ජෛව පරිසරය : සජීව ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු ජලය, වාතය සහ ජීවය, ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා.

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍යය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව.

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම, තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම, හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියා උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

(V) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාව මගින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත්, ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් වාර්තාව, 2003)

## විෂය අරමුණු

01. භාෂාවේ අනන්‍යතාව, සුවිශේෂ බව හා භාෂා රීති හඳුනා ගෙන තොරතුරු ව්‍යක්ත ව, නිරවුල් ව හා නිර්මාණාත්මක ව ප්‍රකාශ කිරීමේ ශක්‍යතා වර්ධනය කර ගැනීම.

02. ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක ලේඛනවල ශිල්පීය මූලධර්ම, ආකෘතික ලක්ෂණ, රචනා රීති හා භාෂා ව්‍යවහාර පිළිබඳ පරිචය ලබා ගැනිම.

03. පුරාතන හා නූතන සාහිත්‍ය කෘති පරිශීලනයෙන් සමාජ, සංස්කෘතික අගයන් අවබෝධ කර ගැනීම, අත්පත් කර ගැනීම හා ජීවිත පරිඥානය පුළුල් කර ගැනීම.

04. වින්දනාත්මක, විචාරාත්මක හා නිර්මාණාත්මක කුසලතා වර්ධනය කර ගනිමින් සාහිත්‍ය කෘති රස වින්දනයට මෙන් ම නිර්මාණකරණයට පෙලඹීම.

05. වර්ධනය වන්නාවූත්, ව්‍යාප්ත වන්නාවූත්, සාහිත්යික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය උකහා ගත හැකි වන පරිදි භාෂා කුසලතා වර්ධනය කර ගනිමින් ජීවිත අභියෝග ජය ගැනීම.

06. භාෂාව හා සාහිත්‍යය පරිශීලනය මගින් ස්වීයත්වය, භාෂා මාමකත්වය, ජාතික අනන්‍යතාව හා සාමකාමී සහජීවනය වර්ධනය කර ගැනීම.

## ජාතික පොදු අරමුණු සහ විෂය අරමුණු අතර සමුබන්ධතාව

| විෂය අරමුණු | ජාතික පොදු අරමුණු | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | i | ii | iii | iv | v | vi | vii | viii |
| 01. භාෂාවේ අනන්‍යතාව, සුවිශේෂ බව හා භාෂා රීති හඳුනා ගෙන තොරතුරු ව්‍යක්ත ව, නිරවුල් ව හා නිර්මාණාත්මක ව ප්‍රකාශ කිරීමේ ශක්‍යතා වර්ධනය කර ගැනීම. | | | | | ✔ | ✔ | ✔ | |
| 02. ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක ලේඛනවල ශිල්පීය මූලධර්ම, ආකෘතික ලක්ෂණ, රචනා රීති හා භාෂා ව්‍යවහාර පිළිබඳ පරිචය ලබා ගැනිම. | | | | | ✔ | | | |
| 03. පුරාතන හා නූතන සාහිත්‍ය කෘති පරිශීලනයෙන් සමාජ, සංස්කෘතික අගයන් අවබෝධ කර ගැනීම, අත්පත් කර ගැනීම හා ජීවිත පරිඥානය පුළුල් කර ගැනීම. | ✔ | | ✔ | ✔ | ✔ | | | ✔ |
| 04. වින්දනාත්මක, විචාරාත්මක හා නිර්මාණාත්මක කුසලතා වර්ධනය කර ගනිමින් සාහිත්‍ය කෘති රස වින්දනයට මෙන් ම නිර්මාණකරණයට පෙලඹීම. | | | ✔ | | ✔ | | | |
| 05. වර්ධනය වන්නාවූත්, ව්‍යාප්ත වන්නාවූත්, සාහිත්යික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය උකහා ගත හැකි වන පරිදි භාෂා කුසලතා වර්ධනය කර ගනිමින් ජීවිත අභියෝග ජය ගැනීම. | | ✔ | | ✔ | ✔ | ✔ | ✔ | ✔ |
| 06. භාෂාව හා සාහිත්‍යය පරිශීලනය මගින් ස්වීයත්වය, භාෂා මාමකත්වය, ජාතික අනන්‍යතාව හා සාමකාමී සහජීවනය වර්ධනය කර ගැනීම. | ✔ | ✔ | ✔ | | | | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 පුරාතන ගද්‍ය සාහිත්‍යය පරිශීලනයෙන් ලබා ගත් මානව ගුණධර්ම හා සංස්කෘතිකාංග මගින් ජීවිත පරිඥානය පුළුල් කර ගනිමින් රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි. | 1.1 පුරාතන ගද්‍ය සාහිත්‍යයේ විකාශනය පැහැදිලි කරයි. | • පුරාතන ගද්‍ය සාහිත්‍යයේ ආරම්භය හා විකාශනය.<br>• ඒ ඒ අවධිවල පුරෝගාමී ගද්‍ය කතුවරුන් හා ඔවුන්ගේ සාහිත්‍ය සේවය අගය කිරීම. | • පුරාතන ගද්‍ය සාහිත්‍යයේ විවිධ අවධි පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• සිංහල ගද්‍ය සාහිත්‍යයේ වර්ගීකරණය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• පුරාතන ගද්‍ය කෘති හා කතුවරුන් නම් කරයි.<br>• පුරාතන ගද්‍ය සාහිත්‍යයේ ලක්ෂණ ඉදිරිපත් කරයි.<br>• පුරාතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ ඇගයීමට ලක් කරයි. | 10 |
| | 1.2 නිර්දිෂ්ට කෘතිවල විශේෂතා, අන්තර්ගතය, භාෂා ලක්ෂණ හා රචනා රීති හඳුනා ගෙන රසවිඳිමින් විමසුමට ලක් කරයි. | • නිර්දිෂ්ට පුරාතන ගද්‍ය කෘතිවල කතුවරු, කාලය, සාහිත්‍ය පසුබිම හා සමාජ සංස්කෘතික පසුබිම හඳුනා ගැනීම.<br>• නිර්දිෂ්ට පුරාතන ගද්‍ය කෘතිවල සුවිශේෂ ලක්ෂණ හඳුනා ගැනීම.<br>• නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨවල තේමාව හා අන්තර්ගතය හඳුනා ගැනීම.<br>• නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨවල අර්ථාවබෝධය හා ඒවා ලිහිල් බසින් ලිවීම.<br>• නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨවල රචනා රීතිය, සාහිත්‍යමය අගය හඳුනා ගැනීම හා රසවින්දනය.<br>නිර්දිෂ්ට පුරාතන ගද්‍ය -<br>• සද්ධර්ම රත්නාවලිය<br>- මට්ටකුණ්ඩලී වස්තුව<br>• පූජාවලිය<br>- අනුරුද්ධ කුමාර කථාව<br>• ජාතක කතා<br>- චන්දකින්නර ජාතකය<br>• සද්ධර්මාලංකාරය<br>- ස්වර්ණතිලකා වස්තුව | • නිර්දිෂ්ට කෘතිවල පසුබිම පිළිබඳ තොරතුරු වගු ගත කරයි.<br>• නිර්දිෂ්ට ගද්‍ය නිර්මාණ අර්ථාව-බෝධයෙන් කියවයි.<br>• නිර්දිෂ්ට ගද්‍ය නිර්මාණවල තේමාව හා අන්තර්ගතය විස්තර කරයි.<br>• නිර්දිෂ්ට කෘතිවල සුවිශේෂතා හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• නිර්දිෂ්ට කෘතිවල භාෂා ලක්ෂණ හා රචනා රීති හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• නිර්දිෂ්ට ගද්‍ය පාඨ ලිහිල් බසින් ලියයි.<br>• නිර්දිෂ්ට පුරාතන ගද්‍ය රස විඳිමින් විචාරය කරයි. | 32 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0 පුරාතන පද්‍ය සාහිත්‍යයේ විකාශනය, ආකෘතික ලක්ෂණ හා ස්වභාවය අධ්‍යයනය කරමින් රසවින්දනයේ හා විචාරයේ යෙදෙයි. | 2.1 පුරාතන පද්‍ය සාහිත්‍යයේ විකාශනය විස්තර කරයි. | • පුරාතන පද්‍ය සාහිත්‍යයේ ආරම්භය හා විකාශනය.<br>• ඒ ඒ අවධිවල පුරෝගාමී කවීන් හා ඔවුන්ගේ සාහිත්‍ය සේවය. | • පුරාතන පද්‍ය සාහිත්‍යයේ විවිධ අවධි වෙන් කොට දක්වයි.<br>• පුරාතන පද්‍ය කෘති හා කතුවරුන් නම් කරයි.<br>• පුරාතන පද්‍ය සාහිත්‍යයේ ලක්ෂණ ඉදිරිපත් කරයි.<br>• පුරාතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ ඇගයීමට ලක් කරයි. | 10 |
| | 2.2 නිර්දිෂ්ට පුරාතන පද්‍ය කෘතිය අර්ථාවබෝධයෙන් යුතු ව කියවා එහි ආකෘතිය, ස්වභාවය හා සමාජ සංස්කෘතික පසුබිම පැහැදිලි කරයි. | • නිර්දිෂ්ට පුරාතන පද්‍ය කෘතියේ සාහිත්‍ය පසුබිම හඳුනා ගැනීම.<br>• ගුත්තිල කාව්‍යයේ තේමාව හා අන්තර්ගතය හඳුනා ගැනීම.<br>• නිර්දිෂ්ට පුරාතන පද්‍ය කෘතියේ විශේෂ ලක්ෂණ හඳුනා ගැනීම.<br>• පුරාතන පද්‍ය කෘතියේ රචනා රීතිය හා සාහිත්‍යමය අගය හඳුනා ගැනීම.<br>• ගුත්තිල කාව්‍යයේ නිර්දිෂ්ට පද්‍යවල අර්ථාවබෝධය හා ඒවා ලිහිල් බසින් ලිවීම.<br>**නිර්දිෂ්ට පුරාතන පද්‍ය -**<br>• **ගුත්තිල කාව්‍යය - වෑත්තෑවේ හිමි (91 - 147 කවි)** | • ගුත්තිල කාව්‍යයෙහි කතුවරයා, කාලය හා සමකාලීන සාහිත්‍ය පසුබිම විස්තර කරයි.<br>• ගුත්තිල කාව්‍යයෙහි තේමාව හා අන්තර්ගතය විස්තර කරයි.<br>• ගුත්තිල කාව්‍යයෙහි සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කරයි.<br>• ගුත්තිල කාව්‍යයෙහි නිර්දිෂ්ට කවිවල අර්ථ පැහැදිලි කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.3 කාව්‍ය විචාර මූලධර්ම හඳුනා ගෙන නිර්දිෂ්ට පද්‍ය නිර්මාණ රස විඳිමින් විචාරයට ලක් කරයි. | • පෙරදිග කාව්‍ය විචාර මූලධර්ම හඳුනා ගැනීම.<br>• සාහිත්‍ය නිර්මාණයක් රස වින්දනයේ දී පාදක කර ගත යුතු මූලික කරුණු හඳුනා ගැනීම.<br>• කාව්‍ය විචාර මූලධර්ම පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට පුරාතන පද්‍ය නිර්මාණ රස වින්දනය හා විචාරය.<br><br>**නිර්දිෂ්ට පුරාතන පද්‍ය -**<br>• **ගුත්තිල කාව්‍යය - වෑත්තෑවේ හිමි (91 - 147 කවි)** | • පෙරදිග කාව්‍ය විචාර මූලධර්ම හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• නිර්දිෂ්ට පුරාතන පද්‍ය කෘතියේ සාහිත්‍යමය අගය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• පෙරදිග කාව්‍ය විචාර මූලධර්ම පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට පුරාතන පද්‍ය රස විඳිමින් විචාරය කරයි. | 12 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 නවකතා සාහිත්‍යාංගයේ ලක්ෂණ හා මුලධර්ම පිළිබඳ අවබෝධයෙන් යුක්ත ව නවකතා රස විඳිමින් විචාරයට ලක් කරයි. | 3.1 නවකතාව නම් සාහිත්‍යාංගයේ ලක්ෂණ හා නවකතාංග විස්තර කරයි. | • නවකතාව යනු කුමක් දැයි නිර්වචන ඇසුරින් පැහැදිලි කිරීම.<br>• නවකතාව නම් වූ සාහිත්‍යාංගයේ ලක්ෂණ හා නවකතාංග හඳුනා ගැනීම.<br>• නවකතාංග<br>  • තේමාව<br>  • කතාව හා කතා වින්‍යාසය<br>  • දෘෂ්ටි කෝණය<br>  • චරිත නිරූපණය<br>  • චෛතසික නිරූපණය<br>  • අවස්ථා හා සිද්ධි නිරූපණය<br>  • පසුබිම් නිරූපණය<br>  • සංකේත නිරූපණය<br>  • භාෂා ලක්ෂණ<br>  • ජීවන දෘෂ්ටිය | • නිර්වචන ඇසුරින් නවකතාව යනු කුමක් දැයි පැහැදිලි කරයි.<br>• නවකතාව නම් වූ සාහිත්‍යාංගයේ ලක්ෂණ විස්තර කරයි.<br>• පරිශීලනය කළ නවකතා ඇසුරින් නවකතාංග සඳහා උදාහරණ ඉදිරිපත් කරයි.<br>• සාහිත්‍යමය වටිනාකමක් සහිත නවකතා තෝරා ගෙන කියවීමට පෙලඹෙයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.2 සිංහල නවකතාවේ ආරම්භය හා විකාශනය පැහැදිලි කරයි. | • දේශීය නවකතාවෙහි ආරම්භය හා විකාශනය (දහනව වන සියවසේ සිට වර්තමානය දක්වා)<br>- ප්‍රබන්ධ සාහිත්‍යයට මග පෑදීම<br>- ප්‍රථම සිංහල නවකතාව<br>- සිංහල නවකතාවේ පුරෝගාමී කතුවරු<br>- සිංහල නවකතාවේ විවිධ තේමා සහ ව්‍යුහාත්මක ලක්ෂණ<br>- සිංහල නවකතාවේ නව ප්‍රවණතා | • සිංහල ප්‍රබන්ධ සාහිත්‍යයට මග පෑදුණු ආකාරය විස්තර කරයි.<br>• සිංහල නවකතාවේ පුරෝගාමී කතුවරුන් හා ඔවුන්ගේ නිර්මාණ නම් කරයි.<br>• පුරෝගාමී කතුවරුන්ගෙන් සිංහල නවකතාවට සිදු වූ සේවය අගය කරයි.<br>• සිංහල නවකතාවේ විවිධ තේමා හා ව්‍යුහාත්මක ලක්ෂණ පැහැදිලි කරයි.<br>• සිංහල නවකතාවේ නව ප්‍රවණතා පිළිබඳ විස්තර කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.3 නවකතාංග කෙරෙහි අවධානයෙන් යුතු ව නිර්දිෂ්ට නවකතාව රස විඳිමින් විචාරයට ලක් කරයි. | ● නිර්දිෂ්ට නවකතාවේ කතුවරයා හා සාහිත්‍ය පසුබිම හඳුනා ගැනීම.<br>● නිර්දිෂ්ට නවකතාවේ තේමාව හා අන්තර්ගතය හඳුනා ගැනීම.<br><br>නිර්දිෂ්ට නවකතාව -<br>● බැද්දේගම - ලෙනාඩ් වුල්ෆ් (ඒ. පී. ගුණරත්න පරිවර්තනය) | ● නිර්දිෂ්ට නවකතාවේ කතුවරයා හා සාහිත්‍ය පසුබිම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>● නිර්දිෂ්ට නවකතාවේ තේමාව හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>● නිර්දිෂ්ට නවකතාවෙන් හෙළි වන සමාජ පසුබිම පැහැදිලි කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0 කෙටිකතා කලාවේ විකාශනය, මූලධර්ම හා විශේෂ ලක්ෂණ හඳුනා ගෙන කෙටිකතා රස විඳිමින් විචාරයේ යෙදෙයි. | 4.1 කෙටිකතා සාහිත්‍යාංගයේ ලක්ෂණ හා කෙටිකතා මූලධර්ම පැහැදිලි කරයි. | • කෙටිකතා සාහිත්‍යාංගය හඳුනා ගැනීම.<br>• කෙටිකතාව නිර්වචනය කිරීම.<br>• කෙටිකතා විචාර මූලධර්ම හා කෙටිකතා ලක්ෂණ හඳුනා ගැනීම.<br>- කතා ප්‍රවෘත්තිය<br>- කතා වින්‍යාසය<br>- චරිතාංග නිරූපණය<br>- චෛතසික නිරූපණය<br>- පසුබිම් නිරූපණය / පරිසර වර්ණනා<br>- යථාර්ථ නිරූපණය<br>- සංකේත භාවිතය<br>- දෘෂ්ටි කෝණය<br>- ජීවන දෘෂ්ටිය<br>- නිර්මාණාත්මක භාෂා ලක්ෂණ<br>- ඒකාබද්ධතාව | • කෙටිකතාව යනු කුමක් දැයි හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• පරිශීලනය කළ කෙටිකතා ඇසුරින් කෙටිකතා ලක්ෂණ ඉදිරිපත් කරයි.<br>• කෙටිකතා විචාර මූලධර්ම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• කෙටිකතා ලක්ෂණ පිළිබඳ අවබෝධයෙන් යුතු ව කෙටිකතා කියවයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 4.2 සිංහල කෙටිකතාවේ ප්‍රභවය හා විකාශනය පැහැදිලි කරයි. | • සිංහල කෙටිකතාවේ ආරම්භය හා විකාශනය (දහනව වන සියවසේ සිට වර්තමානය දක්වා) හඳුනා ගැනීම.<br>• සිංහල කෙටිකතාවේ පුරෝගාමී කතුවරුන් හා ඔවුන්ගේ නිර්මාණ හඳුනා ගැනීම.<br>• දේශීය කෙටිකතාවේ විවිධ තේමා, ආකෘති සහ ප්‍රවණතා හඳුනා ගැනීම. | • සිංහල කෙටිකතාවේ ආරම්භය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• සිංහල කෙටිකතාවේ පුරෝගාමී කතුවරුන්ගේ නිර්මාණ අගය කරයි.<br>• දේශීය කෙටිකතාවේ විවිධ තේමා, ආකෘති සහ ප්‍රවණතා පිළිබඳ පැහැදිලි කරයි.<br>• විවිධ තේමා සහ ආකෘති සහිත කෙටිකතා කියවීමට පෙලඹෙයි. | 06 |
| | 4.3 කෙටිකතා ලක්ෂණ කෙරෙහි අවධානයෙන් යුතු ව නිර්දිෂ්ට කෙටිකතා රස විඳිමින් විචාරයට ලක් කරයි. | • නිර්දිෂ්ට කෙටිකතාවල කතුවරු, කාලය හා සාහිත්‍ය පසුබිම හඳුනා ගැනීම.<br>• නිර්දිෂ්ට කෙටිකතාවල තේමාව හා අන්තර්ගතය හඳුනා ගැනීම.<br>• නිර්දිෂ්ට කෙටිකතාවල ඇතුළත් කෙටිකතා ලක්ෂණ හඳුනා ගැනීම.<br>• නිර්දිෂ්ට කෙටිකතා රස වින්දනය හා විචාරය.<br>නිර්දිෂ්ට කෙටිකතා -<br>• වහල්ලු - මාර්ටින් වික්‍රමසිංහ<br>• වෙසක් පහන - ජී. බී සේනානායක<br>• දිසොන්චිනාහාමි - ගුණදාස අමරසේකර<br>• නොනිමි සිත්තම - කේ. ජයතිලක<br>• වතුර - අජිත් තිලකසේන<br>• නංගී - ඇරැව්වල නන්දිමිත්‍ර<br>• අකුරට යන වෙලාවේ - ඒ. වී. සුරවීර<br>• ස්නේහය - සයිමන් නවගත්තේගම | • නිර්දිෂ්ට කෙටිකතාවල කතුවරු, කාලය හා සාහිත්‍ය පසුබිම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• නිර්දිෂ්ට කෙටිකතා කියවා තේමාව හා අන්තර්ගතය විස්තර කරයි.<br>• නිර්දිෂ්ට කෙටිකතාවල කලාත්මක ලක්ෂණ හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• කෙටිකතා රස විඳිමින් විචාරයට ලක් කරයි. | 21 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 5.0 නාට්‍ය සාහිත්‍යයේ විශේෂතා හා මූලධර්ම පිළිබඳ අවබෝධයෙන් යුතු ව නාට්‍ය පෙළ රස විඳිමින් විචාරය කරයි. | 5.1 නාට්‍යය යනු කුමක් දැයි හඳුනා ගෙන එහි ලක්ෂණ පැහැදිලි කරයි. | • නාට්‍යය යනු කුමක් දැයි නිර්වචනය කිරීම.<br>• නාට්‍ය ප්‍රභේද හා විශේෂ ලක්ෂණ හඳුනා ගැනීම.<br>• ශෛලිගත නාට්‍යයක මූලික ලක්ෂණ හඳුනා ගැනීම.<br>• නාට්‍යය හා නාට්‍ය පෙළ අතර වෙනස හඳුනා ගැනීම.<br>• නාට්‍ය නිර්මාණයක පෙළෙහි සාහිත්‍යමය අගය හඳුනා ගැනීම. | • නිර්වචන ඇසුරින් නාට්‍ය යනු කුමක් දැයි විස්තර කරයි.<br>• නාට්‍ය ප්‍රභේද පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• ශෛලිගත නාට්‍යයක මූලික ලක්ෂණ හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• නාට්‍යය හා නාට්‍ය පෙළ වෙන් වෙන් ව රස විඳිය හැකි අයුරු පැහැදිලි කරයි. | 08 |
| | 5.2 දේශීය නාට්‍ය සාහිත්‍යයේ ආරම්භය හා විකාශනය පැහැදිලි කරයි. | • දේශීය නාට්‍ය සාහිත්‍යයේ ආරම්භය හා විකාශනය හඳුනා ගැනීම. | • දේශීය නාට්‍ය සාහිත්‍යයේ ආරම්භය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• පුරෝගාමී දේශීය නාට්‍යකරුවන්ගේ නිර්මාණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• පුරෝගාමී නාට්‍යකරුවන්ගෙන් දේශීය නාට්‍යයට සිදු වූ සේවය අගය කරයි.<br>• විවිධ නාට්‍ය පෙළ කියවීමට පෙලඹෙයි. | 06 |
| | 5.3 නාට්‍ය විචාර මූලධර්ම හඳුනා ගෙන නිර්දිෂ්ට නාට්‍ය පෙළ රස විඳිමින් විචාරයට ලක් කරයි. | • නාට්‍ය විචාර මූලධර්ම හඳුනා ගැනීම<br>- පෙරදිග<br>- අපරදිග<br>• නිර්දිෂ්ට නාට්‍යයේ කතුවරයා හා ඔහුගේ නිර්මාණ පසුබිම හඳුනා ගැනීම<br>• නිර්දිෂ්ට නාට්‍යයේ තේමාව හා කතා වස්තුව හඳුනා ගැනීම<br><br>**නිර්දිෂ්ට නාට්‍යය -**<br>• **පේමතෝ ජායතී සෝකෝ - එදිරිවීර සරච්චන්ද්‍ර** | • පෙර අපර දෙදිග නාට්‍ය විචාර මූලධර්ම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• නිර්දිෂ්ට නාට්‍යයේ කතුවරයා හා ඔහුගේ නිර්මාණ පිළිබඳ තොරතුරු රැස් කරයි.<br>• නිර්දිෂ්ට නාට්‍යයේ සුවිශේෂතා හඳුනා ගෙන පැහැදිලි කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 නූතන පද්‍ය සාහිත්‍යයේ විකාශනය හා සුවිශේෂතා හඳුනා ගෙන කාව්‍ය විචාර සිද්ධාන්ත පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට පද්‍ය රසවිඳිමින් විචාරයෙහි යෙදෙයි. | 6.1 කවිය නම් සාහිත්‍යාංගයේ ලක්ෂණ හඳුනා ගෙන පැහැදිලි කරයි. | • කවිය යනු කුමක් දැයි නිර්වචනය කිරීම.<br>• කවියෙහි මූලිකාංග හඳුනා ගැනීම.<br>• නූතන කාව්‍යයේ ලක්ෂණ හා විශේෂතා හඳුනා ගැනීම. | • නිර්වචන ඇසුරෙන් කවිය යනු කුමක්දැයි පැහැදිලි කරයි.<br>• නූතන කාව්‍යයේ මූලිකාංග විස්තර කරයි.<br>• නූතන කාව්‍යයේ ලක්ෂණ හා විශේෂතා හඳුනා ගෙන පැහැදිලි කරයි. | 05 |
| | 6.2 නූතන පද්‍ය සාහිත්‍යයේ ප්‍රභවය හා විකාශනය පැහැදිලි කරයි. | • නූතන සිංහල කාව්‍ය සාහිත්‍යයෙහි ආරම්භය හා විකාශනය හඳුනා ගැනීම.<br>• නූතන සිංහල කාව්‍යයේ විවිධ අවධි හා ප්‍රවණතා හඳුනා ගැනීම.<br>• නූතන සිංහල කාව්‍ය සාහිත්‍යයේ විවිධ තේමා, ආකෘති හා භාෂා ලක්ෂණ හඳුනා ගැනීම.<br>• නූතන සිංහල කවීන්ගේ නිර්මාණ පිළිබඳ අවබෝධය ලබා ගැනීම. | • නූතන සිංහල කාව්‍ය සාහිත්‍යයේ සමාරම්භය හා විකාශනය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• නූතන සිංහල කාව්‍යයේ විවිධ අවධි හා ප්‍රවණතා හඳුනා ගෙන විස්තර කරයි.<br>• නූතන සිංහල කාව්‍ය සාහිත්‍යයේ විවිධ තේමා, ආකෘති හා භාෂා ලක්ෂණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• නූතන සිංහල කවීන්ගේ නිර්මාණ පිළිබඳ තොරතුරු රැස් කරයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.3 කාව්‍ය විචාර මූලධර්ම පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට පද්‍ය රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි. | • කාව්‍ය විචාර මූලධර්ම හඳුනා ගැනීම.<br>• නිර්දිෂ්ට නූතන පද්‍ය නිර්මාණවල කතුවරුන් කාලය හා සාහිත්‍ය පසුබිම හඳුනා ගැනීම.<br>• නිර්දිෂ්ට නූතන පද්‍යවල තේමාව, අරමුණ හා අන්තර්ගතය හඳුනා ගැනීම.<br>• නිර්දිෂ්ට නූතන පද්‍යවල විශේෂ ලක්ෂණ හා සාහිත්‍යමය අගය හඳුනා ගැනීම.<br>• කාව්‍ය විචාර මූලධර්ම පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට නූතන පද්‍ය රස වින්දනය හා විචාරය.<br><br>නිර්දිෂ්ට නූතන පද්‍ය -<br>• කොළඹ කවියේ ප්‍රථම යුගය<br>  • ආනන්ද රාජකරුණා -සමනලයා<br>  • ඇස්. මහින්ද හිමි - ලක් මවුනි මගේ<br><br>• කොළඹ කවියේ ද්විතීය යුගය<br>  • පී. බී. අල්විස් පෙරේරා - පැසුණු පැණ<br>  • සාගර පළන්සූරිය - ඉගිලෙන සිහින<br>  • මීමන ප්‍රේමතිලක - අඩසඳ<br>  • විමලරත්න කුමාරගම - වන්නියේ හැන්දෑව<br>  • එච්. එම්. කුඩලිගම - තවමත් ඔබ මගේ ය<br>  • ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ - ළදරු හැඟුම් | • නූතන කාව්‍ය විචාර මූලධර්ම හඳුනා ගෙන විස්තර කරයි.<br>• නිර්දිෂ්ට පද්‍ය නිර්මාණවල කතුවරු, කාලය හා සාහිත්‍ය පසුබිම හඳුනා ගෙන විස්තර කරයි.<br>• නිර්දිෂ්ට නූතන පද්‍ය නිර්මාණවල සුවිශේෂතා පැහැදිලි කරයි.<br>• නිර්දිෂ්ට නූතන පද්‍යවල කලාත්මක අගය විමසමින් රස විඳියි. | 24 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7.0 භාෂාවේ ස්වරූපය පිළිබඳ අවබෝධයෙන් යුතු ව භාෂාව ව්‍යවහාර කරයි. | 7.1 භාෂාවේ සම්මත ව්‍යවහාරය හඳුනා ගෙන භාෂාව භාවිත කරයි. | • භාෂාව දෙයාකාරයකින් භාවිත වන බව හඳුනා ගැනීම.<br>- භාෂණය (ශ්‍රව්‍ය ගෝචර සංකේත)<br>- ලේඛනය (දෘශ්‍ය ගෝචර සංකේත) | • භාෂා භාවිතයේ ස්වරූප දෙක හඳුනා ගෙන විස්තර කරයි.<br>• භාෂණ ව්‍යවහාරයේ ස්වභාවය පැහැදිලි කරයි.<br>• ලේඛන ව්‍යවහාරයේ ස්වභාවය පැහැදිලි කරයි.<br>• භාෂණය හා ලේඛනය අතර වෙනස්කම් විස්තර කරයි.<br>• ලේඛන ව්‍යවහාරය හා භාෂණ ව්‍යවහාරය වෙන් වෙන් ව භාවිත කළ යුතු බව ප්‍රකාශ කරයි. | 05 |
| | 7.2 සිංහල අක්ෂර මාලාව පිළිබඳ දැනුම පාදක කර ගෙන අක්ෂර විචාරය කරයි. | • සිංහල අක්ෂර මාලාව හැඳින්වීම හා අක්ෂර වර්ගීකරණය<br>• අක්ෂර මාලාවේ අන්තර්ගත, ලේඛන ව්‍යවහාරයේ බහුල භාවිතයට පැමිණි හා නොපැමිණි අක්ෂර<br>• ලේඛන ව්‍යවහාරයේ බහුල භාවිතයට නොපැමිණි අකුරු අක්ෂරමාලාවට ඇතුළත් කිරීමට හේතු<br>• සිංහල 'අ'කාරයේ සංවෘත විවෘත භේදය<br>• විදේශීය වචන උච්චාරණය හා සිංහල අකුරෙන් ලියන ආකාරය<br>• රූප භේදයක් ඇතත් උච්චාරණයේ වෙනසක් නොමැති අක්ෂර<br>• යංශය හා රකාරාංශය භාවිතය | • සිංහල අක්ෂර විවිධ ප්‍රභේද යටතේ වර්ග කර දක්වයි.<br>• සිංහල අක්ෂර නිවැරදි ව නම් කරයි.<br>• ලේඛන ව්‍යවහාරයේ බහුල භාවිතයට නොපැමිණි අකුරු, අක්ෂර මාලාවට ඇතුළත් කිරීමට හේතු පැහැදිලි කරයි.<br>• සිංහල 'අ'කාරයේ සංවෘත විවෘත භේදය හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• විදේශීය වචන සිංහල අකුරෙන් නිවැරදි ව ලියා දක්වයි.<br>• රූප භේදයක් ඇතත් උච්චාරණයේ වෙනසක් නොමැති අක්ෂර මොනවාදැයි පැහැදිලි කරයි.<br>• යංශය හා රකාරාංශය නිවැරදි ව භාවිත කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.3 නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු ව ලියයි. | • අක්ෂර වින්‍යාස රීති හඳුනා ගැනීම සහ භාවිතය. | • අක්ෂර වින්‍යාස රීති හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• නිවැරදි අක්ෂර වින්‍යාසය භාවිත කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• නිවැරදි අක්ෂර වින්‍යාසය භාවිත කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 08 |
| | 7.4 අනුරූප පද සංයෝගය, නිවැරදි භාෂා ව්‍යවහාරය සඳහා යොදා ගනියි. | • නිෂ්පන්න, තත්සම, තද්භව, පද හඳුනා ගැනීම.<br><br>• අනුරූප ලෙස පද සංයෝග කිරීම. | • අනුරූප පද සංයෝගය යනු කුමක් දැයි පැහැදිලි කරයි.<br>• නිෂ්පන්න, තත්සම, තද්භව පද වෙන් වෙන් ව හඳුනා ගෙන විස්තර කරයි.<br>• නිෂ්පන්න, තත්සම හා තත්භව පද අනුරූප ලෙස සංයෝග කිරීමේ වැදගත්කම විස්තර කරයි.<br>• අනුරූප පද නිවැරදි ලෙස සංයෝග කරමින් භාවිත කරයි. | 08 |
| | 7.5 සන්ධි විධි භාවිත කරමින් භාෂාව සුබනම්‍ය ලෙස හසුරුවයි. | • සන්ධි විධි<br>i. ලෝපය<br>ii. ආදේශය<br>iii. ආගමය<br><br>(ප්‍රායෝගික උදාහරණ ඇසුරෙන්) | • 'සන්ධි' යනු කුමක් දැයි නිර්වචනය කරයි.<br>• උදාහරණ දක්වමින් සන්ධි විධි පැහැදිලි කරයි.<br>• සුබනම්‍ය භාෂා භාවිතය සඳහා සන්ධිවල වැදගත්කම පැහැදිලි කරයි.<br>• සන්ධි අර්ථාන්විත ව භාවිත කරමින් භාෂා කාර්යයේ යෙදෙයි. | 22 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | • සන්ධි ප්‍රභේද<br>- පූර්ව ස්වර ලෝප සන්ධි<br>- පර ස්වර ලෝප සන්ධි<br>- ස්වර සන්ධි<br>- ස්වරාදේශ සන්ධි<br>- ගාත්‍රාදේශ සන්ධි<br>- පූර්ව රූප සන්ධි<br>- පර රූප සන්ධි<br>- ගාත්‍රාක්ෂර ලෝප සන්ධි<br>- ආගම සන්ධි<br>- ද්විත්ව රූප සන්ධි<br><br>• මිශ්‍ර සිංහල සන්ධි<br>- සමාන ස්වර දීර්ඝ සන්ධි<br><br>- | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0 වියරණ රීති හා භාෂා සම්ප්‍රදාය නිවැරදි ව හඳුනා ගෙන භාවිත කරයි. | 8.1 පද සාධනය, පද භාවිතය පිළිබඳ ප්‍රායෝගික හැකියාව ප්‍රදර්ශනය කරයි. | ● නාම<br>★ නාම ප්‍රකෘති<br>★ නාමයකින් ප්‍රකෘතිය වෙන් කර ගැනීමේ ක්‍රම<br>★ නාම පදයක මූලික ලක්ෂණ<br>★ වචන භේදය (ඒක, බහු)<br>★ ලිංග භේදය (පුල්ලිංග, ස්ත්‍රී ලිංග, නපුංසක ලිංග)<br>★ සචේතන - අචේතන භේදය,<br>★ නියත - අනියත භේදය<br>● නාම ප්‍රභේද (නාම නාම, සර්ව නාම, සංඛ්‍යා නාම, ප්‍රත්‍යයාර්ථ නාම, සමාස නාම)<br>★ නාම නාම (ජාති, ද්‍රව්‍ය, ගුණ, ක්‍රියා, සංඥා)<br>★ සර්ව නාම (පුරුෂ භේදය, ලිංග භේදය, වචන භේදය)<br>★ සංඛ්‍යා නාම<br>● නාම වරනැගීම<br>★ විභක්ති<br>- ප්‍රථමා<br>- කර්ම<br>- කර්තෘ<br>- කරණ<br>- සම්ප්‍රදාන<br>- අවධි<br>- සම්බන්ධ<br>- ආධාර<br>- ආලපන | ● නාම ප්‍රකෘතියක් යනු කුමක් දැයි හඳුනා ගෙන විස්තර කරයි.<br>● නාම පදයකින් ප්‍රකෘතිය වෙන් කොට දක්වයි.<br>● නාම පදයක මූලික ලක්ෂණ විස්තර කරයි.<br>● නාම ප්‍රභේද හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● නාම ප්‍රකෘතියක් විවිධ ස්වරූපවලට නගමින් නාම විභක්තිවල වරනගයි. | 30 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | ● ක්‍රියා<br>★ ධාතු ප්‍රකෘති<br>★ ක්‍රියාවකින් ප්‍රකෘතිය වෙන් කර ගැනීමේ ක්‍රම<br>★ ක්‍රියා පදයක මූලික ලක්ෂණ<br>- වචන භේදය<br>- පුරුෂ භේදය<br>- කාල භේදය (අතීත, අනතීත)<br>★ ක්‍රියා වර නැගීම<br>★ ක්‍රියා ප්‍රභේද<br>★ අවසාන ක්‍රියා<br>- ආඛ්‍යාත, කෘදන්ත ක්‍රියා, නාම ක්‍රියා, ආශීර්වාද ක්‍රියා, (ප්‍රාර්ථනා ක්‍රියා)<br>- විධි ක්‍රියා<br>- ප්‍රයෝජ්‍ය ක්‍රියා<br>★ අනවසාන ක්‍රියා<br>- පූර්ව ක්‍රියා<br>- අපර ක්‍රියා<br>- මිශ්‍ර ක්‍රියා<br>- අසම්භාව්‍ය ක්‍රියා | ● ක්‍රියා ප්‍රකෘතියක් යනු කුමක් දැයි හඳුනා ගෙන විස්තර කරයි.<br>● ක්‍රියා පදයකින් ප්‍රකෘතිය වෙන් කොට දක්වයි.<br>● ක්‍රියා පදයක මූලික ලක්ෂණ විස්තර කරයි.<br>● ක්‍රියා ප්‍රභේද හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● ක්‍රියා ප්‍රකෘතියක් විවිධ ස්වරූපවලට නගමින් ක්‍රියා පද වරනගයි.<br>● අවසාන ක්‍රියා සහ අනවසාන ක්‍රියා යන්න පැහැදිලි කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | ● විශේෂණ<br>- නාම විශේෂණ<br>- ක්‍රියා විශේෂණ | ● නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ යනු කුමක් දැයි පැහැදිලි කරයි.<br>● නාම විශේෂණ සඳහා නිදසුන් දක්වයි.<br>● ක්‍රියා විශේෂණ සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.<br>● විශේෂණ උචිත පරිදි භාෂාවේ භාවිත කරයි. | |
| | | ● සමාස<br>- අව්‍යය සමාස<br>- විභක්ති සමාස<br>- විශේෂණ සමාස<br>- අන්‍යාර්ථ සමාස<br>- ද කාරාර්ථ සමාස | ● සමාස යනු කුමක් දැයි විස්තර කරයි.<br>● සමාස ප්‍රභේද සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.<br>● සමාස භාවිතයේ ප්‍රයෝජන විස්තර කරයි. | |
| | | ● ප්‍රත්‍යයාර්ථ නාම<br>- තද්ධිත නාම<br>- කෘදන්ත නාම | ● ප්‍රත්‍යයාර්ථ නාම යනු කුමක් දැයි විස්තර කරයි.<br>● තද්ධිත නාම සෑදෙන ආකාරය නිදසුන් සහිත ව විස්තර කරයි.<br>● තද්ධිත නාමයක ප්‍රකෘතිය සහ ප්‍රත්‍යය වෙන් කොට දක්වයි.<br>● විවිධ අර්ථ ගෙන දෙන තද්ධිත ප්‍රත්‍ය සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.<br>● කෘදන්ත නාම සෑදෙන ආකාරය නිදසුන් සහිත ව විස්තර කරයි.<br>● කෘදන්ත ප්‍රභේද හඳුනා ගෙන උදාහරණ දක්වයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | • නිපාත | • නිපාත හඳුනා ගෙන විස්තර කරයි.<br>• නිපාත විවිධ ප්‍රභේද යටතේ වර්ග කර දක්වයි.<br>• නිපාත වෙන් කොට ලිවිය යුතු බව පැහැදිලි කරයි.<br>• භාෂා භාවිතයේ දී නිපාත උචිත පරිදි යොදා ගනියි. | |
| | | • උපසර්ග | • උපසර්ග හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• උපසර්ගවලින් ඉටු වන විවිධ කාර්යයන් සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.<br>• භාෂා භාවිතයේ දී උපසර්ග අර්ථවත් ලෙස යොදා ගනියි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 8.2 උක්ත - ආඛ්‍යාත යෝගය පිළිබඳ රීති නිවැරදි ව භාවිත කරමින් වාක්‍ය ලියයි. | • උක්ත, ආඛ්‍යාත පද සම්බන්ධය<br>- උක්ත, අනුක්ත භේදය<br>- උක්ත, අනුක්ත භේදය පිළිබඳ වාක්‍ය රීති | • උක්ත - අනුක්ත භේදය පිළිබඳ රීති හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• වාක්‍ය වින්‍යාස රීති නිවැරදි ව භාවිතයේ වැදගත්කම විස්තර කරයි.<br>• උක්ත - අනුක්ත භේදය පිළිබඳ රීති නිවැරදි ව අනුගමනය කරමින් වාක්‍ය ලියයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 9.0 සංශ්ලේෂණ හා විශ්ලේෂණ පරිචය ප්‍රදර්ශනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 9.1 සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරමින් විචාරශීලී ව කරුණු සංවිධානය කරමින් ශාස්ත්‍රීය, විචාරාත්මක හා නිර්මාණාත්මක රචනා ලියයි. | ● ශාස්ත්‍රීය ලිපි ලේඛන පරිශීලනය හා වාක්‍ය රචනය<br>- සාම්ප්‍රදායික/ නූතන කලා ශිල්ප, සංස්කෘතිකාංග, කාලීන, ජාතික හා ජාත්‍යන්තර සමාජ, ආර්ථික දේශපාලනික හා ආධ්‍යාපනික ප්‍රවණතා<br>- විද්‍යාව, තාක්ෂණය, තොරතුරු තාක්ෂණය හා සන්නිවේදනය වැනි විෂය අලළා සම්පාදිත ශාස්ත්‍රීය ලේඛන හා නිර්මාණාත්මක ලේඛන පරිශීලනය<br>- නිර්මාණාත්මක රචනා සම්පාදනය | ● මාතෘකානුකූල රචනා ලිවීම සඳහා අවශ්‍ය තොරතුරු රැස් කරයි.<br>● මාතෘකාවට අදාළ ව රචනාවේ සැලැස්ම ගොඩනගයි.<br>● රචනා ලිවීමේ දී තර්කානුකූල ව කරුණු සංවිධානය කරයි.<br>● සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරමින් රචනා ලියයි. | 05 |
| | 9.2 සංශ්ලේෂණ ශක්‍යතා දක්වමින් සාරාංශකරණයේ යෙදෙයි. | ● අනිර්දිෂ්ට ගද්‍ය පාඨයක් සාරාංශ කිරීම. | ● සාරාංශකරණයේ වැදගත්කම විස්තර කරයි.<br>● සාරාංශකරණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු පැහැදිලි කරයි.<br>● ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය කරමින් සාරාංශ ලියයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| | 9.4 අනිර්දිෂ්ට ගද්‍ය පාඨවල අන්තර්ගතය අවබෝධ කර ගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | අනිර්දිෂ්ට ගද්‍ය පාඨවල අන්තර්ගතය අවබෝධ කර ගැනීම<br>- (ශාස්ත්‍රීය ලිපි, ලේඛන, සංවාද ඇසුරෙන්) | • අනිර්දිෂ්ට ගද්‍ය පාඨ කියවා දුරවබෝධ වචනවල අර්ථ පැහැදිලි කරයි.<br>• ගද්‍ය පාඨයක අන්තර්ගතය වටහා ගැනීම සඳහා අවබෝධයෙන් කියවීමේ වැදගත්කම විස්තර කරයි.<br>• අනිර්දිෂ්ට ගද්‍ය පාඨ කියවා මූලික අදහස ඉදිරිපත් කරයි.<br>• අනිර්දිෂ්ට ගද්‍ය පාඨවල අන්තර්ගත අදහස ලිහිල් බසින් ලියයි. | 05 |
| | 9.5 නිර්දිෂ්ට ගද්‍ය පාඨ ඇසුරෙන් විවිධ ලේඛන ශෛලි හඳුනා ගෙන භාෂා කාර්යයේ යෙදෙයි. | • විවිධ ලේඛකයන්ගේ ලේඛන ඇසුරෙන්<br>- ලේඛන ආකෘතිය<br>- භාෂා ශෛලිය<br>- ලේඛන රීතිය<br>- ඉලක්කගත පාඨකයා හඳුනා ගැනීම.<br>• **නිර්දිෂ්ට ලේඛන**<br>- **හෙළ හවුලේ ලේඛන**<br>- **විද්‍යා ලේඛන**<br>- **ශාස්ත්‍රීය ලේඛන**<br>- **ජන මාධ්‍ය ලේඛන**<br>- **භාෂණ ව්‍යවහාරය පදනම් කර ගත් ලේඛන**<br>• උචිත ආකෘතිය හා ශෛලිය භාවිත කරමින් ලේඛනයේ යෙදීම.<br>- පුවත්පත් වාර්තා රචනය | • විවිධ ලේඛනවල ආකෘති හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• විවිධ ලේඛකයන්ගේ භාෂා රටා හඳුනා ගෙන විස්තර කරයි.<br>• විවිධ ලේඛන සඳහා උචිත භාෂා ශෛලි පවතින බව විස්තර කරයි.<br>• ලේඛනයේ ස්වභාවය අනුව උචිත ආකෘතිය හා භාෂා ශෛලිය තෝරා ගනියි.<br>• පුවත්පත් වාර්තාවක ස්වරූපය විස්තර කරයි.<br>• උචිත ආකෘතියට අනුව නිවැරදි ව භාෂාව හසුරුවමින් පුවත්පත් වාර්තා රචනා කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 පුරාතන ගද්‍ය සාහිත්‍යය පරිශීලනයෙන් ලබා ගත් මානව ගුණධර්ම හා සංස්කෘතිකාංග මගින් ජීවිත පරිඥානය පුළුල් කර ගනිමින් රස වින්දනයේ හා විචාරයේ යෙදෙයි. | 1.2 නිර්දිෂ්ට කෘතිවල සුවිශේෂතා, අන්තර්ගතය, භාෂා ලක්ෂණ හා රචනා රීති හඳුනා ගෙන රස විඳිමින් විමසුමට ලක් කරයි. | • නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨවල තේමාව හා අන්තර්ගතය හඳුනා ගැනීම.<br>• නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨවල අර්ථාවබෝධය හා ඒවා ලිහිල් බසින් ලිවීම.<br>• නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨවල රචනා රීතිය හා සාහිත්‍යමය අගය හඳුනා ගැනීම හා රස වින්දනය.<br><br>**නිර්දිෂ්ට පුරාතන ගද්‍ය -**<br><br>• **සද්ධර්ම රත්නාවලිය**<br>- **කුණ්ඩලකේසීගේ වස්තුව**<br><br>• **පූජාවලිය**<br>- **ජීවක වෛද්‍යවරයාගේ කථාව**<br><br>• **ජාතක කතා**<br>- **චුල්ල ධනුද්දර ජාතකය**<br><br>• **සද්ධර්මාලංකාරය**<br>- **නන්දිවාණිජ වස්තුව** | • නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨවල තේමාව, සන්දර්භය හා භාෂාවේ සුවිශේෂතා හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨ අර්ථාවබෝධයෙන් යුක්ත ව ලිහිල් බසින් ලියයි.<br>• නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨවල සාහිත්‍යමය අගය හඳුනා ගෙන රස විඳිමින් විචාරය කරයි. | 32 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.3 නිර්දිෂ්ට කථා වින්දනාත්මක ව පරිශීලනයෙන් හඳුනා ගත් මානව ගුණධර්ම හා සමාජ හර පද්ධතීන් භාවිතයට ගනියි. | • නිර්දිෂ්ට පුරාතන ගද්‍ය පාඨ පරිශීලනය කොට පුරාතන ගද්‍ය සාහිත්‍යය මගින් ප්‍රකට වන මානව ගුණධර්ම, හර පද්ධති හඳුනා ගැනීම හා ප්‍රායෝගික භාවිතය.<br>• සාහිත්‍ය නිර්මාණකරණයට යොමු වීම. | • පුරාතන ගද්‍ය සාහිත්‍යය පරිශීලනයෙන් හඳුනා ගත් මානව ගුණධර්ම විස්තර කරයි.<br>• මානව ගුණධර්ම හා හර පද්ධති ඇසුරෙන් චරිත සංවර්ධනය ගොඩනගා ගත යුතු බව පැහැදිලි කරයි.<br>• අත්පත් කර ගත් මානව ගුණධර්ම සුරකිමින් සාහිත්‍ය නිර්මාණකරණයේ යෙදෙයි. | 09 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0 පුරාතන පද්‍ය සාහිත්‍යයේ විකාශනය, ආකෘතික ලක්ෂණ හා ස්වභාවය අධ්‍යයනය කරමින් රස වින්දනයේ හා විචාරයේ යෙදෙයි. | 2.3 කාව්‍ය විචාර මූලධර්ම හඳුනා ගෙන, නිර්දිෂ්ට පද්‍ය නිර්මාණ රස විඳිමින් විචාරයට ලක් කරයි. | • කාව්‍ය විචාර මූලධර්ම පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට පුරාතන පද්‍ය නිර්මාණ රස වින්දනය හා විචාරය.<br><br>නිර්දිෂ්ට පුරාතන පද්‍ය -<br>• ගුත්තිල කාව්‍යය - වැත්තෑවේ හිමි (148 - 317 කවි) | • පෙරදිග කාව්‍ය විචාර මූලධර්ම පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට පුරාතන පද්‍ය රස විඳිමින් විචාරය කරයි.<br>• නිර්දිෂ්ට පුරාතන පද්‍ය රස වින්දනයෙන් ලත් පරිචය ඇසුරෙන් වෙනත් කාව්‍ය නිර්මාණ රසවින්දනයට පෙලඹෙයි. | 35 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0.නවකතා සාහිත්‍යාංග-යේ ලක්ෂණ හා මූලධර්ම පිළිබඳ අවබෝධයෙන් යුක්ත ව නවකතා රස විඳිමින් විචාරයට ලක් කරයි. | 3.3 නවකතාංග කෙරෙහි අවධානයෙන් යුතු ව නිර්දිෂ්ට නවකතාව රස විඳිමින් විචාරයට ලක් කරයි. | • නවකතාංග පිළිබඳ අවධානයෙන් යුතු ව නිර්දිෂ්ට නවකතාව රස වින්දනය හා විචාරයට ලක් කිරීම.<br><br>නිර්දිෂ්ට නවකතාව -<br>• බැද්දේගම - ලෙනාඩ් වුල්ෆ් (ඒ. පී. ගුණරත්න පරිවර්තනය) | • නිර්දිෂ්ට නවකතාවේ ඇතුළත් නවකතාංග හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• නිර්දිෂ්ට නවකතාවේ කලාත්මක ලක්ෂණ පැහැදිලි කරයි.<br>• නිර්දිෂ්ට නවකතාවෙන් හෙළි වන සමාජ පසුබිම පැහැදිලි කරයි.<br>• නිර්දිෂ්ට නවකතාව රස විඳිමින් විචාරයට ලක් කරයි. | 28 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0.කෙටිකතා කලාවේ විකාශනය, මූලධර්ම හා විශේෂ ලක්ෂණ හඳුනා ගෙන කෙටිකතා රස විඳිමින් විචාරයේ යෙදෙයි. | 4.3 කෙටිකතා ලක්ෂණ කෙරෙහි අවධානයෙන් යුතු ව නිර්දිෂ්ට කෙටිකතා රස විඳිමින් විචාරයට ලක් කරයි. | • නිර්දිෂ්ට කෙටිකතාවල කතුවරුන්, කාලය හා සාහිත්‍ය පසුබිම හඳුනා ගැනීම.<br>• නිර්දිෂ්ට කෙටිකතාවල තේමාව හා අන්තර්ගතය හඳුනා ගැනීම.<br>• නිර්දිෂ්ට කෙටිකතාවල ඇතුළත් කෙටිකතා ලක්ෂණ හඳුනා ගැනීම.<br>• නිර්දිෂ්ට කෙටිකතා රස වින්දනය හා විචාරය.<br>**නිර්දිෂ්ට කෙටිකතා -**<br>• කපිතන්ගේ පුත්තු - දයාසේන ගුණසිංහ<br>• මිනිස් වටය - එරික් ඉලයප්ආරච්චි<br>• කරත්තය - සෝමරත්න බාලසූරිය<br>• කළු සපත්තු- ජයතිලක කම්මැල්ලවීර<br>• කවියෙකුට අත්දැකීමක් - රංජිත් ධර්මකීර්ති<br>• ගස් - නිශ්ශංක විජේමාන්න<br>• හැත්තෑ ලක්ෂයෙන් එකෙක් - ලියනගේ අමරකීර්ති<br>• නිදහස් උදෑසන - කීර්ති වැලිසරගේ | • නිර්දිෂ්ට කෙටිකතාවල කතුවරු, කාලය හා සාහිත්‍ය පසුබිම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• නිර්දිෂ්ට කෙටිකතා කියවා තේමාව හා අන්තර්ගතය විස්තර කරයි.<br>• නිර්දිෂ්ට කෙටිකතාවල කලාත්මක ලක්ෂණ හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• කෙටිකතා රස විඳිමින් විචාරයට ලක් කරයි. | 30 |
| | 4.4 කෙටිකතා ලක්ෂණ කෙරෙහි අවබෝධයෙන් යුතු ව කෙටිකතා නිර්මාණකරණයේ යෙදෙයි. | • විවිධ කෙටිකතා පරිශීලනය කිරීම.<br>• කෙටිකතාවලට පාදක වූ අත්දැකීම් හඳුනා ගැනීම.<br>• විවිධ අත්දැකීම් පාදක කර ගෙන කෙටිකතා නිර්මාණය කිරීම. | • කෙටිකතාවලට පාදක වූ විවිධ අත්දැකීම් හඳුනා ගෙන විස්තර කරයි.<br>• කෙටිකතා නිර්මාණය සඳහා සුදුසු අත්දැකීම් තෝරා ගනියි.<br>• සාර්ථක කෙටිකතාවක මූලික ලක්ෂණ සහ අත්දැකීම් පදනම් කොට ගෙන කෙටිකතා නිර්මාණයේ යෙදෙයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 5.0 නාට්‍ය සාහිත්‍යයේ සුවිශේෂතා හා මූලධර්ම පිළිබඳ අවබෝධයෙන් යුතු ව නාට්‍ය රස විඳිමින් විචාරය කරයි. | 5.3 නාට්‍ය විචාර මූලධර්ම හඳුනා ගෙන නිර්දිෂ්ට නාට්‍ය පෙළ රස විඳිමින් විචාරයට ලක් කරයි. | • නාට්‍ය විචාර මූලධර්ම පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට නාට්‍ය පෙළ රස විඳීම හා විචාරය<br><br>**නිර්දිෂ්ට නාට්‍යය -**<br>• **පේමතෝ ජායතී සෝකෝ - එදිරිවීර සරච්චන්ද්‍ර** | • නිර්දිෂ්ට නාට්‍යයේ සුවිශේෂතා හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• නිර්දිෂ්ට නාට්‍ය පෙළ රස විඳිමින් විචාරය කරයි. | 16 |
| | 5.4 නාට්‍යයක මූලික ලක්ෂණ හඳුනා ගෙන නාට්‍ය පිටපත් රචනා කරයි. | • විවිධ නාට්‍ය පිටපත් පරිශීලනය කිරීම.<br>• නාට්‍යෝචිත අවස්ථා හඳුනා ගැනීම.<br>• නාට්‍ය පිටපත් රචනා කිරීම. | • නාට්‍ය නිර්මාණය සඳහා සුදුසු තේමා හා නාට්‍යෝචිත අවස්ථා හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• විවිධ නාට්‍ය පෙළවල ඇතුළත් කලාත්මක ලක්ෂණ හඳුනා ගෙන විස්තර කරයි.<br>• විවිධ නාට්‍ය පෙළ කියවීමට පෙලඹෙයි.<br>• සාර්ථක නාට්‍ය පෙළෙක මූලික ලක්ෂණ හා නාට්‍යෝචිත අවස්ථා පාදක කරගෙන නාට්‍ය පිටපත් රචනා කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 නූතන පද්‍ය සාහිත්‍යයේ විකාශය හා සුවිශේෂතා හඳුනා ගෙන කාව්‍ය විචාර සිද්ධාන්ත පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට පද්‍ය රස විඳිමින් විචාරයෙහි යෙදෙයි. | 6.3 කාව්‍ය විචාර පොදු මූලධර්ම පිළිබඳ අවබෝධයෙන් යුතු ව නිර්දිෂ්ට පද්‍ය රසාස්වාදයේ හා විචාරයේ යෙදෙයි. | • නිර්දිෂ්ට නූතන පද්‍ය නිර්මාණවල කතුවරුන්, කාලය හා සාහිත්‍ය පසුබිම<br>• නිර්දිෂ්ට නූතන පද්‍යවල තේමාව, අරමුණ හා අන්තර්ගතය හඳුනා ගැනීම<br>• නිර්දිෂ්ට නූතන පද්‍යවල විශේෂ ලක්ෂණ හා සාහිත්‍යමය අගය හඳුනා ගැනීම<br>• කාව්‍ය විචාර මූලධර්ම අනුව නිර්දිෂ්ට නූතන පද්‍ය රස වින්දනය හා විචාරය<br><br>නිර්දිෂ්ට නූතන පද්‍ය -<br><br>• හෙළ හවුලේ කවි<br>• කුමාරතුංග මුනිදාස -නැළැවිල්ල<br>• රැ. තෙන්නකෝන් - හැවිල්ල<br>• අරීසෙන් අහුබුදු - මඟුල් ගීය<br><br>• නිදහස් කවියේ ප්‍රථම යුගය<br>• ජී. බී. සේනානායක - දෙවියන් මැරීම<br>• සිරි ගුනසිංහ - අබිනික්මන<br>• ගුණදාස අමරසේකර - අඳුර අපේ දුක නිවාවි<br>• මහගම සේකර - මාර යුද්ධය<br>• විමල් දිසානායක - නාගල කන්ද | • නිර්දිෂ්ට පද්‍ය නිර්මාණවල කතුවරු, කාලය හා සාහිත්‍ය පසුබිම හඳුනා ගෙන විස්තර කරයි.<br>• නිර්දිෂ්ට නූතන පද්‍ය නිර්මාණවල සුවිශේෂතා පැහැදිලි කරයි.<br>• නිර්දිෂ්ට නූතන පද්‍යවල කලාත්මක අගය විමසමින් රස විඳියි. | 32 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | • නිදහස් කවියේ පශ්චාත් යුගය<br>• පරාක්‍රම කොඩිතුවක්කු - දේදුන්න පායාවි හෙටත් පාලම උඩින්<br>• මොනිකා රුවන්පතිරණ - පොඩි දුව<br>• දයාසේන ගුණසිංහ - රන්තැටියක කඳුළු<br>• බුද්ධදාස ගලප්පත්ති - දුරු රට ගිය පුතු<br>• රත්න ශ්‍රී විජේසිංහ - පරමල්<br>• නන්දන වීරසිංහ - ආදරණීය පාසල<br>• ආරියවංශ රණවීර - තුරු සෙනඟ හා තණ පඳුර<br>• ධර්මසිරි රාජපක්ෂ - නංගීගේ රහසිගත සෙනෙහෙ වීණාව<br>• ලාල් හැගොඩ - සතුට | | |
| | 6.4 නූතන පද්‍ය නිර්මාණවල විශේෂ ලක්ෂණ හඳුනා ගනිමින් නිර්මාණකරණයේ යෙදෙයි. | • කාව්‍ය නිර්මාණ පරිශීලනය කිරීම.<br>• කාව්‍ය නිර්මාණයට උචිත අත්දැකීම් ගොනු කර ගැනීම.<br>• විවිධ තේමා හා ආකෘති ඔස්සේ කාව්‍ය නිර්මාණකරණයේ යෙදීම. | • කාව්‍ය නිර්මාණ පරිශීලනය කර විශේෂ ලක්ෂණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• විවිධ කාව්‍ය නිර්මාණවලට පාදක වූ අත්දැකීම් විස්තර කරයි.<br>• කාව්‍ය නිර්මාණයට උචිත තේමා හා අත්දැකීම් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• විවිධ ආකෘතින්ට අනුව කාව්‍ය නිර්මාණකරණයේ යෙදෙයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0 වියරණ රීති හා භාෂා සම්ප්‍රදාය නිවැරදි ව භාවිත කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 8.2 උක්ත - ආඛ්‍යාත යෝගය පිළිබඳ රීති නිවැරදි ව භාවිත කරමින් වාක්‍ය ලියයි. | • උක්ත, ආඛ්‍යාත පද සම්බන්ධය<br>- වාක්‍ය රීති<br><br>• කාරක භේදය<br>- කර්තෘ කාරක වාක්‍ය<br>- කර්ම කාරක වාක්‍ය<br><br>• ප්‍රකෘති කථනය, විකෘති කථනය | • උක්ත ආඛ්‍යත පද සම්බන්ධ රීති හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• කාරක භේදය පිළිබඳ රීති පැහැදිලි කරයි.<br>• කාරක භේදය නිවැරදි ව හඳුනා ගෙන භාවිත කරයි.<br>• වාක්‍ය රීති නිවැරදි ව භාවිත කිරීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.<br>• ලේඛනයේ දී උක්ත ආඛ්‍යත පද සම්බන්ධ රීති නිවැරදි ව භාවිත කරයි.<br>• ප්‍රකෘති කථනය හා විකෘති කථනය හඳුනා ගෙන නිවැරදි ව විස්තර කරයි.<br>• ප්‍රකෘති කථනය හා විකෘති කථනය නිවැරදි ව යොදමින් වාක්‍ය ලියයි. | 50 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 9.0 සංශ්ලේෂණ හා විශ්ලේෂණ පරිචය ප්‍රදර්ශනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 9.1 සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරමින් විචාරශීලී ව කරුණු සංවිධානය කර ශාස්ත්‍රීය, විචාරාත්මක හා නිර්මාණාත්මක රචනා ලියයි. | • ශාස්ත්‍රීය ලිපි ලේඛන පරිශීලනය හා වාක්‍ය රචනය<br>- සාම්ප්‍රදායික/ නූතන කලා ශිල්ප, සංස්කෘතිකාංග, කාලීන, ජාතික හා ජාත්‍යන්තර සමාජ, ආර්ථික දේශපාලනික හා ආධ්‍යාපනික ප්‍රවණතා<br>- විද්‍යාව, තාක්ෂණය, තොරතුරු තාක්ෂණය හා සන්නිවේදනය යන විෂය අලළා සම්පාදිත ශාස්ත්‍රීය ලේඛන හා නිර්මාණාත්මක ලේඛන පරිශීලනය<br>- නිර්මාණාත්මක රචනා සම්පාදනය | • මාතෘකානුකූල රචනා ලිවීම සඳහා අවශ්‍ය තොරතුරු රැස් කරයි.<br>• මාතෘකාවට අදාළ ව රචනාවේ සැලැස්ම ගොඩනගයි.<br>• රචනා ලිවීමේ දී තර්කානුකූල ව කරුණු සංවිධානය කරයි.<br>• සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරමින් රචනා ලියයි. | 11 |
| | 9.2 සංශ්ලේෂණ ශක්‍යතා දක්වමින් සාරාංශකරණයේ යෙදෙයි. | • අනිර්දිෂ්ට ගද්‍ය පාඨයක් සාරාංශ කිරීම. | • සාරාංශකරණයේ වැදගත්කම විස්තර කරයි.<br>• සාරාංශකරණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු පැහැදිලි කරයි.<br>• ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය කරමින් සාරාංශ ලියයි. | 11 |
| | 9.3 භාෂණ ව්‍යවහාරයෙන් ඇති පාඨ වර්තමාන ලේඛන ව්‍යවහාරයෙන් ලියයි. | • භාෂණ ව්‍යවහාරයෙන් ඇති පාඨ සමකාලීන (අද්‍යතන) සිංහලයට නංවා ලිවීම | • භාෂණ ව්‍යවහාරයෙන් හා ලිඛිත ව්‍යවහාරයෙන් ඇති පාඨ අතර වෙනස හඳුනා ගෙන පැහැදිලි කරයි.<br>• භාෂණය හා ලේඛනය අතර වෙනස්කම් පවතින බව පිළිගනියි.<br>• භාෂණ ව්‍යවහාරය අද්‍යතන ලිඛිත ව්‍යවහාරයට හරවා ලියයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 9.4 අනිර්දිෂ්ට පාඨවල අන්තර්ගතය අවබෝධ කර ගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | • අනිර්දිෂ්ට ගද්‍ය පාඨවල අන්තර්ගතය අවබෝධ කර ගැනීම<br>- (ශාස්ත්‍රීය ලිපි, ලේඛන, සංවාද ඇසුරෙන්) | • අනිර්දිෂ්ට ගද්‍ය පාඨ කියවා දුරවබෝධ වචනවල අර්ථ පැහැදිලි කරයි.<br>• ගද්‍ය පාඨයක අන්තර්ගතය වටහා ගැනීම සඳහා අවබෝධයෙන් කියවීමේ වැදගත්කම විස්තර කරයි.<br>• අනිර්දිෂ්ට ගද්‍ය පාඨ කියවා මූලික අදහස ඉදිරිපත් කරයි.<br>• අනිර්දිෂ්ට ගද්‍ය පාඨවල අන්තර්ගත අදහස ලිහිල් බසින් ලියයි. | 06 |
| | 9.5 නිර්දිෂ්ට ගද්‍ය පාඨ ඇසුරෙන් විවිධ ලේඛන ශෛලි හඳුනා ගෙන භාෂා කාර්යයේ යෙදෙයි. | • උචිත ආකෘතිය හා ශෛලිය භාවිත කරමින් ලේඛනයේ යෙදීම.<br>- විශේෂාංග ලිපි<br>- තීරු ලිපි<br>- ශාස්ත්‍රීය ලිපි | • විවිධ ලේඛන සඳහා උචිත ආකෘති හා භාෂා ශෛලි පවතින බව විස්තර කරයි.<br>• විශේෂාංග ලිපියක විශේෂ ලක්ෂණ හඳුන්වයි.<br>• තීරු ලිපියක විශේෂතා විස්තර කරයි.<br>• ශාස්ත්‍රීය ලිපි යනු මොනවාදැයි පැහැදිලි කරයි.<br>• ලේඛනයේ ස්වභාවය අනුව උචිත ආකෘතිය හා භෂා ශෛලිය තෝරා ගනියි.<br>• නිර්මාණශීලී ලෙසත් නිවැරදිවත් භාෂාව හසුරුවමින් ලේඛනයේ යෙදෙයි. | 18 |

## (ඇ) පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

කිසියම් විෂයකට අදාළ විෂය නිර්දේශයක් සකස් කරනුයේ එම විෂය හදාරන ශිෂ්‍ය ප්‍රජාවට පොදුවේ ගැළපෙන පරිදි ය. එසේ වුවත් පන්ති කාමර මට්ටමෙන් එම විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ දී පවත්නා භෞතික පරිසරය මෙන් ම එක් එක් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ කායික, මානසික ස්වභාවය කෙරෙහි ද අවධානය යොමු කිරීමට සිදු වනු ඇත. සිංහල විෂය සම්බන්ධව ද මෙය පොදු තත්ත්වයකි.

එබැවින් සිංහල විෂයට අදාළ පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පාසලේ පවතින පහසුකම් අනුව ගුරුවරයා විසින් සුදුසු පරිදි සැලසුම් කර ගත යුතු ය. තව ද පන්ති කාමරයට පමණක් සීමා නොවූ ප්‍රායෝගික ඉගෙනුම් අවස්ථා වෙත ද ශිෂ්‍යයා යොමු කළ යුතු ය. භාෂාව හා සාහිත්‍යය පිළිබඳ දැනුම, අවබෝධය මෙන් ම රසවින්දනය ද ශිෂ්‍යයා තුළ වර්ධනය වීමට තුඩු දෙන විෂය සමගාමී හා විෂය බාහිර ක්‍රියාකාරකම් මේ සඳහා ඉවහල් කර ගත හැකි ය.

- දේශන
- සාකච්ඡා
- කේවල හා කණ්ඩායම් ක්‍රියාකාරකම්
- රස වින්දන වැඩසටහන්

ආදී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද මෙන් ම,

- බිත්ති පුවත් පත් හා සඟරා
- සාහිත්‍ය සංගම්/උත්සව
- පුස්තකාල පරිහරණය
- ක්ෂේත්‍ර චාරිකා
- නාට්‍ය
- භාෂා තරග
- භාෂා දින වැඩසටහන්/ප්‍රදර්ශන
- ජන මාධ්‍ය

ආදිය ද ඵලදායී අයුරින් යොදා ගෙන ශිෂ්‍යයාගේ භාෂා කුසලතා වර්ධනයට අත්වැලක් ලබා දිය හැකි ය.

## (ඇ) තක්සේරුව හා ඇගයීම

අ. පො. ස උසස් පෙළ විෂය මාලාවේ 12 සහ 13 ශ්‍රේණි යටතේ වසර දෙකක කාලසීමාවකින් අනතුරු ව අ. පො. ස. උසස් පෙළ විභාගයට මුහුණ දීමට ශිෂ්‍යයාට සිදු වෙයි. උක්ත විභාගය මෙම විෂය නිර්දේශයට අදාළ ජාතික මට්ටමේ ඇගයීම වශයෙන් සැලකිය හැකි ය. මේ හැරෙන්නට පන්ති කාමර මට්ටමෙන් ක්‍රියාත්මක වන දෛනික ඇගයීම් වැඩපිළිවෙළක් සහ වාර අවසාන හා වර්ෂ අවසාන විභාග ක්‍රමයක් පාසල විසින් උචිත පරිදි සැලසුම් කර ගත යුතු ය. පාසල් පාදක ඇගයීම් වශයෙන්;

- කේවල පැවරුම්
- කණ්ඩායම් පැවරුම්
- වාචික අභ්‍යාස
- ලිඛිත අභ්‍යාස

ආදිය යොදා ගත හැකි ය.

නිපුණතා මට්ටම් 1.3 යටතේ ඇති සාහිත්‍ය නිර්මාණකරණය, 6.4 යටතේ ඇති කාව්‍ය නිර්මාණකරණය, 4.4 යටතේ ඇති කෙටිකතා නිර්මාණකරණය, 5.4 යටතේ ඇති නාට්‍ය පිටපත් රචනා කිරීම, 9.5 යටතේ ඇති පුවත්පත් වාර්තා රචනය, විශේෂාංග ලිපි රචනය, තීරු ලිපි රචනය හා ශාස්ත්‍රීය ලිපි සකස් කිරීම යන විෂය කොටස් පාසල් පාදක ඇගයීම් යටතේ ඇගයීමට ලක් කළ හැකි ය.

## (ඉ) නිර්දිෂ්ට ග්‍රන්ථ

### පුරාතන ගද්‍ය

- සද්ධර්මරත්නාවලිය (ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම සංස්.)
  - කුණ්ඩලකේශී වස්තුව
  - මට්ටකුණ්ඩලී වස්තුව

- පූජාවලිය (ඒ. වී. සුරවීර සහ තවත් අය සංස්.)
  - අනුරුද්ධ කුමාර කථාව - ''කපිලවස්තු පුරයෙහි ශුද්ධෝදන රජ්ජුරුවන් මල්..'' යන තන්හි සිට ''... අනුරුද්ධ මහ තෙරුන් වහන්සේ යැයි මේ නමින් ..ප්‍රසිද්ධ වූ සේක'' යන තැනට
  - ජීවක වෛද්‍යවරයාගේ කථාව - ''විශාලා මහ නුවර අම්බපාලී නම් ගණිකාවක් ඇත'' යන තැන සිට ''.. තමන්ගෙන් ජීවකයන්ට ප්‍රසාද දුන්හ'' යන තැනට

- ජාතක කතා පොත
  - චන්දකින්නර ජාතකය
  - චුල්ල ධනුද්දර ජාතකය

- සද්ධර්මාලංකාරය (බෙන්තර ශ්‍රද්ධාතිෂ්‍ය සංස්.)
  - ස්වර්ණතිලකා වස්තුව
  - නන්දිවාණිජ වස්තුව

### පුරාතන පද්‍ය

- ගුත්තිල කාව්‍යය - වෑත්තෑවේ හිමි (ඩබ්ලියු. එෆ්. ගුණවර්ධන සංස්කරණය)
  91 - 317 කවි ( කවි 226ක් )

### නවකතා

- බැද්දේගම - ලෙනාඩ් වුල්ෆ් (ඒ. පී. ගුණරත්න පරිවර්තනය)

## කෙටිකතා

- වහල්ලු - මාර්ටින් වික්‍රමසිංහ
- වෙසක් පහන - ජී. බී සේනානායක
- දිසොන්චිනාහාමි - ගුණදාස අමරසේකර
- නොනිමි සිත්තම - කේ. ජයතිලක
- වතුර - අජිත් තිලකසේන
- නංගී - ඇරැව්වල නන්දිමිත්‍ර
- අකුරට යන වෙලාවේ - ඒ. වී. සුරවීර
- ස්නේහය - සයිමන් නවගත්තේගම
- කපිතන්ගේ පුත්තු - දයාසේන ගුණසිංහ
- මිනිස් වටය - එරික් ඉලයප්ආරච්චි
- කරත්තය - සෝමරත්න බාලසූරිය
- කළු සපත්තු- ජයතිලක කම්මැල්ලවීර
- කවියෙකුට අත්දැකීමක් - රංජිත් ධර්මකීර්ති
- ගස් - නිශ්ශංක විජේමාන්න
- හැත්තෑ ලක්ෂයෙන් එකෙක් - ලියනගේ අමරකීර්ති
- නිදහස් උදෑසන - කීර්ති වැලිසරගේ

## නාට්‍ය

- පේමතෝ ජායතී සෝකෝ - එදිරිවීර සරච්චන්ද්‍ර

## නූතන පද්‍ය

- **කොළඹ කවියේ ප්‍රථම යුගය**
  - ආනන්ද රාජකරුණා - සමනලයා
  - ඇස්. මහින්ද හිමි - ලක් මවුනි මගේ

- **කොළඹ කවියේ ද්විතීය යුගය**
  - පී. බී. අල්විස් පෙරේරා - පැසුණු පැණ
  - සාගර පළන්සූරිය - ඉගිලෙන සිහින
  - මීමන ප්‍රේමතිලක - අඩසඳ
  - විමලරත්න කුමාරගම - වන්නියේ හැන්දෑව
  - එච්. එම්. කුඩලිගම - තවමත් ඔබ මගේ ය
  - ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ - ළදරු හැඟුම්

- **හෙළ හවුලේ කවි**
  - කුමාරතුංග මුනිදාස - නැළැවිල්ල
  - රැ. තෙන්නකෝන් - හැවිල්ල
  - අරිසෙන් අහුබුදු - මඟුල් ගීය

- **නිදහස් කවියේ ප්‍රථම යුගය**
  - ජී. බී. සේනානායක - දෙවියන් මැරීම
  - සිරි ගුනසිංහ - අබිනික්මන
  - ගුණදාස අමරසේකර - අඳුර අපේ දුක නිවාවි
  - මහගම සේකර - මාර යුද්ධය
  - විමල් දිසානායක - නාගල කන්ද

- **නිදහස් කවියේ පශ්චාත් යුගය**
  - පරාක්‍රම කොඩිතුවක්කු - දේදුන්න පායාවි හෙටත් පාලම උඩින්
  - මොනිකා රුවන්පතිරණ - පොඩි දුව
  - දයාසේන ගුණසිංහ - රන්තැටියක කඳුළු
  - බුද්ධදාස ගලප්පත්ති - දුරු රට ගිය පුතු
  - රත්න ශ්‍රී විජේසිංහ - පරමල්
  - නන්දන වීරසිංහ - ආදරණීය පාසල
  - ආරියවංශ රණවීර - තුරු සෙනඟ හා තණ පඳුර
  - ධර්මසිරි රාජපක්ෂ - නංගීගේ රහසිගත සෙනෙහෙ වීණාව
  - ලාල් හැගොඩ - සතුට

# (ඊ) විෂය නිර්දේශ සම්පාදක මණ්ඩලය

**අභ්‍යන්තර**

- එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම, අධ්‍යක්ෂ, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.
- ඊ. ආර්. නිමල් ප්‍රේමකුමාර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.
- කේ. ඥානවිමල හිමි, කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.
- එම්. ජී. මුණසිංහ, කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.
- මංගල ගුණරත්න, කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.
- රුවනි සිසිජා, සහකාර කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.

බාහිර

- සේවාර්ජිත මහාචාර්ය විමල් ජී. බලගල්ලේ, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ.
- සේවාර්ජිත මහාචාර්ය ජේ. බී. දිසානායක, කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ.
- විශ්‍රාමික මහාචාර්ය රත්න විජේතුංග, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ.
- විශ්‍රාමික මහාචාර්ය තිස්ස ජයවර්ධන, කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ.
- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය හර්සන් ඩයස්, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.
- මහාචාර්ය රත්නසිරි අරංගල, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ.
- මහාචාර්ය අගලකඩ සිරිසුමන හිමි, කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ.
- එස්. ඕ. ප්‍රනාන්දු, විශ්‍රාමික අධ්‍යක්ෂ, සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.
- එච්. පී. සුසිල් සිරිසේන, කථිකාචාර්ය, හාපිටිගම් අධ්‍යාපන විද්‍යාපීඨය, මීරිගම.